# A COMPARATIVE STUDY OF TITLES IN THE BADULU PILLAR INSCRIPTION THROUGH SECONDARY SOURCES

Anurin Indika Divakara[1] and Anusha Sajeewanie Rubasinghe[2]

## Abstract

This study investigates the professionals delineated within the Badulu Pillar inscription, focusing on analyzing their designated responsibilities and contextual applications. The research delves into an analysis of the nomenclature of these positions as portrayed in secondary sources and elucidates their associated responsibilities. The primary objectives of this research encompass two key facets: augmenting information from secondary sources pertinent to the positions under scrutiny and conducting an analytical assessment, culminating in the presentation of insightful perspectives and recommendations. The methodology employed for this study is derived from the text of the Badulu Pillar inscription featured in Epigraphia Zeylanica. The research applies an analytical lens drawing from a spectrum of secondary sources, predominantly academic dictionaries and scholarly texts. Maharaju, the King, Apa, Mahaya, Dadanayake, Gathan, Mandradin, Mahagramayan, Ulvadukathakkaru, Gama awadiya Atadena and the Varada Atadena were the focal points of this exploration. The study extensively examines the descriptions of these positions outlined in the Badulu Pillar inscription, providing an in-depth analysis of their responsibilities, culminating in findings and conclusive insights.

**Keywords:** Badulu Tam Letter, Epigraphia Zeylanica, Maharaja, Apa, Mahaya

---

[1] Professor, Department of Sinhala, University of Kelaniya

Email: anurin@kln.ac.lk https://orcid.org/0009-0003-4800-7175

[2] Senior Assistant Librarian, The Library, University of Kelaniya Sri Lanka.

Email: sajeewanie@kln.ac.lk https://orcid.org/0000-0002-6291-2836

Accepted the revised version: 01 December 2023. This work is licensed under C BY-SA 4.0. To view a copy of this license, visit http://creativecommons.org/licenses/by-sa/4.0/

# බදුලු ටැම් ලිපියේ තනතුරු නාම පිළිබඳ ද්විතීයික මූලාශ්‍ර ඇසුරින් අධ්‍යයනයක්


**සාරසංක්ෂේපය**

මෙම පර්යේෂණයේ දී බදුලු ටැම් ලිපියේ ඇතුළත් තෝරාගත් තනතුරු නාම පිළිබඳ අධ්‍යයනයට ලක් වෙයි. මෙහි ඇතුළත් තනතුරු යෙදී ඇති අවස්ථාවන්ට අනුකූල ව මෙන් ම යෙදී ඇති ආකාරය ද ඒ තනතුරුවලට පැවරී තිබූ රාජකාරි පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක් එබැවින් මෙහි දී සිදු වෙයි. එහි දී ද්විතීයික මූලාශ්‍රවල ඒ තනතුරු නාම විග්‍රහ කර ඇති ආකාරය මෙන් ම ඒ සඳහා රාජකාරි හිමිව තිබූ අයුරු ද මේ පර්යේෂණයේ දී විමර්ශනයට හසු විය. ඒ අනුව පර්යේෂණයේ මූලික අරමුණු දෙකකි. එනම් අධ්‍යයනයට ලක්වන තනතුරු නාමවලට ද්විතීයික මූලාශ්‍රවල දක්වා ඇති කරුණු එක්තැන් කිරීම හා ඒවා විශ්ලේෂණාත්මක ව විග්‍රහ කරමින් ඒ තනතුරුවලට හිමිව තිබූ රාජකාරී පිළිබඳ ව අදහස් හා යෝජනා ඉදිරිපත් කිරීම යි. එහි දී පර්යේෂණ ක්‍රමවේදය බවට පත්වූයේ Epigraphia Zeylanica හි ඇතුළත් බදුලු ටැම් ලිපියේ පෙළ උපයුක්ත කොට අධ්‍යයනයට භාවිත ද්විතීයික මූලාශ්‍ර ඇසුරින් විශ්ලේෂණාත්මක විග්‍රහයක යෙදීම යි. ද්විතීයික මූලාශ්‍ර භාවිතයේ දී ශබ්ද කෝෂ, ශාස්ත්‍රීය හා පර්යේෂණ ග්‍රන්ථ, ශාස්ත්‍රීය හා පර්යේෂණ සඟරා මෙන් ම සාර සංක්ෂේප පාදක කොට ගැනුණි. මහරජු, රජු, ඇපා, මහයා, දඬනායක, ගැත්තන්, මන්ද්‍රඩීන්, මහාග්‍රාමයන්, උල්වාඩුකණක්කරුන්, ගම අඬවිය අට දෙනා හා වරද අටදෙනා යන තනතුරු නාම මෙහි දී තෝරාගත් තනතුරු නාම යි. බදුලු ටැම් ලිපියට අනුව සඳහන් ව ඇති තනතුරු අතර මොවුන්ගේ රාජකාරිය අත්‍යවශ්‍ය වී ඇති බවක් පෙනී යයි. එබැවින් මේ තනතුරු නාම පදනම් කොටගෙන ඔවුන්ට හිමිව තිබූ රාජකාරීන් පිළිබඳ ව මෙහි දී කරුණු දක්වා ඇත. එසේ ම අධ්‍යයනය අවසානයේ දී මේ තනතුරු බදුලු ටැම් ලිපියට අනුව මොනවාද යන්නත් ඒ ඒ තනතුරුවලට පැවරී තිබූ රාජකාරී මොනවාද යන්නත් ප්‍රතිඵල හා නිගමවල දී දීර්ඝ වශයෙන් අධ්‍යයනයට භාජනය කොට තිබේ.


**ප්‍රමුඛ පදඃ** බදුලු ටැම් ලිපිය, තනතුරු නාම, රාජකාරිය, Epigraphia Zeylanica

**හැඳින්වීම හා පර්යේෂණ පසුබිම**

ශිලා ලිපි විෂය කොටගත් මේ පර්යේෂණය මගින් ක්‍රි.ව. 10වන සියවසට අයත් බදුලු ටැම් ලිපියේ තනතුරු නාම පිළිබඳ ද්විතීයික මූලාශ්‍ර ඇසුරින් අධ්‍යයනය සිදුවෙයි. බදුලු ටැම් ලිපිය හොරබොරවැව ප්‍රදේශයට අයත් වූ හෝපිටිගමු ගම හා වෙළෙඳපළට අයත් වූවකි. ඌව පළාතට අයත් මහියංගනය ප්‍රදේශයට සැතපුම් තුනක් (3) පමණ ඊශාන දෙසට වන්නට සොරබොරවැව ප්‍රදේශය පිහිටා ඇත. හෝපිටිගමු ප්‍රදේශයේ ඉංග්‍රීසි පාලනය යටතේ සේවය කළ ආණ්ඩුවේ උප ඒජන්තවරයකු වූ *John Bailey* මෙය සොයාගෙන ඇති අතර බදුලු නගරයට රැගෙනවිත් පිහිට වූ නිසා මේ ලිපිය බදුලු ටැම් ලිපිය බවට පත්ව ඇත. මේ ලිපියේ තත්කාලීන සමාජය පිළිබඳ ව විශ්වසනීය වූ තොරතුරු රැසක් අනාවරණය කොට ගත හැකිය. IV වන උදය (සිරි සංඝබෝධි උදය) (ක්‍රි.ව. 946-954) රාජ්‍ය සමයට අයත් වූවක් වන අතර රාජ්‍යත්වයට පත්වී දෙවන අවුරුද්දේ කරවා ඇති බව සෙල්ලිපියේ ඇතුළත් ය. "සිරිසඟබො උදාමහ රදහුනුමා සත්ලැගු දෙවන හවුරුදුයෙහි නිකින්නි ස(න්ද්) අව විසෙනියි සොර බරහි ආවූ හොපිටිගමු පදියැ වැපාර(ය)න් ...(අ ; 11-17 පේළි)" මේ ලිපියේ ඇතුළත් ප්‍රධාන කරුණු වන්නේ හෝපිටිගමු ගම සහ ඒ වෙළෙඳ පොළේ පූර්වයේ පැවති සිරිත් කඩ කොට සිදු නොවිය යුතු අයුතු දේවල් සිදුවේ යැයි රජතුමා මහියංගණයට පැමිණි අවස්ථාවේ දී දැන්වීම හේතු කොටගෙන ගමේත්, වෙළෙඳ පොළේත් විධිමත් පාලනය සඳහා රජුගේ හා රාජ්‍ය නිලධාරීන්ගේ ප්‍රධානත්වයෙන් පනවන ලද ව්‍යවස්ථාවකි (Wickramasinghe, 1929, P. 70p).

**අරමුණ**

මෙහි ප්‍රධාන අරමුණු දෙකකි. එහි දී බදුලු ටැම් ලිපියේ තනතුරු නාම සඳහා විවිධ විද්වතුන් විසින් දක්වා ඇති අදහස් එක්තැන් කිරීම එක් අරමුණකි. දෙවැනි අරමුණ වන්නේ බදුලු ටැම් ලිපියේ ඇතුළත් ව ඇති තනතුරු නාම අධ්‍යයනය යි. එහි දී ද ඒ තනතුරු නාම අධ්‍යයනයේ වෙනත් විද්වතුන් දක්වා ඇති අර්ථකථන පිළිබඳ ව අධ්‍යයනය කරමින් බදුලු ටැම් ලිපියේ ඇතුළත් කරුණු ද විශ්ලේෂණය කරමින් ඒ ද්විතියික මූලාශ්‍ර ඇසුරින් ඒ තනතුරුවලින් ලබාගෙන ඇති සේවාව හා බැඳුණ රාජකාරීන් විමර්ශනයට හසු කිරීම මෙම අධ්‍යයනයේ දෙවන අරමුණ යි.

**පර්යේෂණ ගැටලුව**

මේ තනතුරු නාම මෙන් ම එයින් ලබාගෙන ඇති සේවාව පිළිබඳ ව විවිධ විද්වතුන් අදහස් දක්වා ඇත. මෙහි දී එම අදහස් එකතු කිරීම මූලික වශයෙන් ම සිදුවෙයි. තව ද ඒ පිළිබඳ ව අධ්‍යයනයෙන් හා ද්විතීයක මූලාශ්‍ර ඇසුරින් බදුලු ටැම් ලිපියේ අන්තර්ගත කරුණු විශ්ලේෂණයෙන් ඒ තනතුරුවලින් ලබාගත් රාජකාරීන් පිළිබඳ

අදහස් ඉදිරිපත් කෙරේ. පූර්ව ද්විත්ව අරමුණු මත තනතුරු නාම පිළිබඳ මෙවැනි වූ සෘජු අධ්‍යයනයක පවතින රික්තය මෙයින් වැළකෙන අතර එය මේ පර්යේෂණයේ ගැටලුව ද වෙයි.

**සාහිත්‍ය විමර්ශනය හා පර්යේෂණ සීමාව**

ප්‍රමුඛ මූලාශ්‍රය ලෙස Epigraphia Zeylanica ඇසුරින් මූලික දත්ත ලබා ගැනුණ ද අධ්‍යයනය සිදුවන්නේ ද්විතීයික මූලාශ්‍ර ඇසුරින් ය. ද්විතීයික මූලාශ්‍රවල දී සුමංගල ශබ්ද කෝෂය, සෙල්ලිපි වදන් අකාරාදිය, අභිලේඛන, මැදඋයන්ගොඩ විමලකීර්ති හිමියන්ගේ සෙල්ලිපි පාදක ග්‍රන්ථ, කොත්මලේ අමරවංශ හිමියන්ගේ ලක්දිව සෙල්ලිපි මෙන් ම බදුලු ටැම් ලිපිය පිළිබඳ ව සිදුව ඇති විවිධ ශාස්ත්‍රීය ග්‍රන්ථ, ලිපි ආදිය භාවිත කෙරේ. බදුලු ටැම් ලිපියේ විවිධ සමාජ, සංස්කෘතික, දේශපාලන හා ආර්ථික කරුණු බොහෝ සෙයින් මේ වන විට අධ්‍යයනයට ලක්වී ඇත. ඒ ඇසුරින් දත්ත විශ්ලේෂණය සිදු වෙයි. පර්යේෂණයේ සීමාව බදුලු ටැම් ලිපිය හා එහි ඇතුළත් තනතුරු නාම පිළිබඳ ව විද්වතුන් දක්වා ඇති අදහස් ය.

**ප්‍රතිඵල හා සාකච්ඡාව**

බදුලු ටැම් ලිපිය අන්තර්ගත කරුණුවලට අනුව හඳුනාගත හැකි තනතුරු නාම අතුරින් විශ්ලේෂණය සඳහා තෝරාගත් තනතුරු නාම වන්නේ මහරජ, රජ, ඈපා, මහයා, දඬනායක, ගැත්තන්, මන්ද්‍රඩීන්, මහාග්‍රාමයන්, රදොලන්, උල්වාඩු කණක්කරුන්, ගම අඩවිය අටදෙනා හා වරද අට දෙනාය. මේ තනතුරු නාම පිළිබඳ ව බදුලු ටැම් ලිපියේ අන්තර්ගත කරුණු හා ද්විතීයික මූලාශ්‍රවල ඇතුළත් කරුණු ඇසුරින් මෙම අධ්‍යයනය සිදුවිය.

අනුරාධපුර යුගයේ ක්‍රි. පූ. තුන්වන සියවසේ සිට තනතුරු නාම පිළිබඳ අවධානය යොමු කිරීමේ දී ක්‍රි. පූ. තුන්වන සියවසේ සිට කොටවා ඇති මේ ලේඛනවලින් ප්‍රධාන වශයෙන් සිදුකර ඇත්තේ රජවරුන්, විවිධ ප්‍රභූවරුන්, නිලධාරීන් හෝ ඔවුන්ගේ ඥාතීන් විශේෂයෙන් ම භික්ෂූන් වහන්සේලා උදෙසා විවිධ දීමනා ලබා දීමයි. එහි දී තනතුරු ලබාදුන් මෙන් ම තනතුරු ලබාගත් අය පිළිබඳ ව සඳහන් කරමින් ජනතාව දැනුවත් කිරීමක් සිදුව ඇත. අනුරාධපුර අවසාන භාගයේ දී වැඩි වශයෙන් හඳුනාගත හැකි වන්නේ අධිකරණ ව්‍යවස්ථාවන් ය. අධ්‍යයනයට උපයුක්ත බදුලු ටැම් ලිපිය ද එවැනි ව්‍යවස්ථාවක් වශයෙන් සැලකීමට අවකාශ වෙයි. කෙසේ වුව ද බදුලු ටැම් ලිපිය ඇතුළු මෙම ලේඛනවල රාජවංශික පුවත්, රාජ්‍ය පාලනයට එකතුවූවන්ගේ නිල නාම, තනතුරු නාම මෙන් ම ප්‍රශස්ති, රාජකීය විරුදාවලි මෙන් ම එවැනි ලේඛනවලින් බලාපොරොත්තු වී ඇති අරමුණු ද ඇතුළත්ය.

බදුලු ටැම් ලිපියෙන් මහරජ පිළිබඳ ව තොරතුරු රාශියක් හෙළිදරව් කරගත හැකිය. එමෙන් ම සෙල්ලිපි මෙන් ම සාහිත්‍ය මූලාශ්‍රයවලට ද අනුව මෙකල මහරජ හා රජ යන්න භාවිත කොට ඇත්තේ සමස්ත රටේ ම පාලනය ගෙන ගිය නායකයාටයි. මහරජුට මෙන් ම රජුට වත්හිමියන්, වැඩිතැන මෙන් ම වහන්සේ වැනි ආදේශක නාම ද මෙහි දී භාවිතව පැවති බව මේ පිළිබඳව කරුණු විශ්ලේෂණයේදී හඳුනාගත හැකි විය. බදුලු ටැම් ලිපියට අනුව ලංකාවේ රාජ්‍යත්වයට පවත්වන රජු උසස් කුලයකින් මෙන් ම උසස් වංශ පරම්පරාවකින් පැවත ආ යුතුයි. එමෙන් ම ලංකාවේ ම කෙනෙක් ම විය යුතුයි. මව හා පියා ද උසස් කුලයකින් හා වංශ පරම්පරාවකින් පැවත ආ යුතු අතර රාජ්‍යත්වයට පත්වීමට පෙර ඈපා, ආදිපාද මෙන් ම මහාදිපා ද තනතුරු ද දරා තිබිය යුතු බවත් සෙල්ලිපියේ සඳහන් ය. මේ බදුලු ටැම් ලිපියට අනුව රාජ්‍යත්වය ලැබීමට අවශ්‍ය වන මූලික සුදුසුකම් ය.

සුමංගල ශබ්ද කෝෂයට අනුව රජ යන්න රාජයා, ශ්‍රේෂ්ඨ, ප්‍රධාන යන අර්ථ දී ඇත. අනුරාධපුර යුගයේ රටේ ප්‍රධාන පාලකයා 'රජ' නමින් හඳුන්වා ඇත (සෝරත හිමි, 1999, පි. 824). මේ පිළිබඳ ව අවධානය යොමු කිරීමේ දී ලක්දිව රාජ්‍යත්වය 'රජු' යන්න ආරම්භය කෙසේ සිදු වී දැයි නිශ්චිතව දැක්විය නොහැකිය. නමුත් මහාවංශ කතුවරයාට අනුව මෙරට රාජාවලියේ ඇරඹුම විජයරාජ අවදියට එකතු වෙයි (බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය, 2003, පරි. 69, 70, 71, ගාථා අර්ත පි. 37). කෙසේ වුව ද ඉතිහාස තොරතුරු අධ්‍යයනයේ දී විජය රජුගෙන් පසුව පසුකාලීනව රජ බවට පැමිණි රජවරුන් දේශීය සම්ප්‍රදායන්ට අනුව රාජාභිෂේකය ලැබුව ද සම්මතයට අනුව රාජ්‍යත්වය නිසි ලෙස ස්ථාපිත වී ඇත්තේ දේවානම්පියතිස්ස රජුගේ අභිෂේකයෙන් පසුව ය. ඒ මෞර්ය අධිරාජයාගේ අනුග්‍රහයෙන් සිදු වූවක් බව ඉතිහාසගත ය (බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය, 2003, පරි. 22 – 23, ගාථා අර්ථ පි. 56). එතැන් සිට ලංකාවේ රාජ්‍යත්වය නිසි ලෙස පූර්ණත්වයට පත් වූ බව සම්මතයයි. පියාගෙන් පුතාට හෝ වැඩිමහල් සහෝදරයාගෙන් සහෝදරයාට රාජ්‍ය උරුමය සිදුව ඇත.

රටේ භූමි ප්‍රමාණයේ විශාලත්වය මෙන් රටේ පාලනය විධිමත් ව ගෙන යාමට රජුට හා යුවරජුට හැකියාවක් නොවූ නිසා රාජ්‍ය පාලනයේ විධිමත් බව උදෙසා විවිධ අමාත්‍ය මණ්ඩලයක් මෙන් ම නිලධාරී පිරිසක් ද පත්කරගෙන සිටි බව සෙල්ලිපිවලින් පැහැදිලි වෙයි.

රජු, රාජ්‍යත්වය යන තනතුරු කෙරෙහි අවධානය යොමු කිරීමේ දී මූලාශ්‍රවලට අනුගත වීමේ දී අග්ගඤ්ඤ සූත්‍රයට අනුව පාලකයා දෙවියන්ගේ නිර්මාණයක් නොවන වග පෙන්වා දෙයි. සමාජ සම්මුතියක ප්‍රතිඵලයක් ලෙස රාජ්‍ය ප්‍රභවය වී ඇති බව එහි දැක්වේ (බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය, 1996 ; සිංහල සූත්‍රපිටක ග්‍රන්ථ මාලා අංක 01, පි. 298), බෞද්ධ දර්ශනයට අනුව රජු, පාලකයා ජනහිතකාමීයකු විය යුතු බව සඳහන් වේ (බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය, 1996 ; සිංහල සූත්‍රපිටක ග්‍රන්ථ මාලා. චක්කවත්ති සීහනාද සූත්‍රය, පි. 294).

බෞද්ධ ඉගැන්වීම මත සම්පූර්ණයෙන් ම දැහැමි මෙන් ම විධිමත් ආචාරධර්ම පද්ධතියකට අනුව රජෙක් පාලන ක්‍රමවේදය ගෙන යා යුතුයි. බෞද්ධ ඉගැන්වීම් මත රාජ්‍යත්වය ලබන්නෙකු දේව නිර්මාණයෙන් ඇති වූවෙකු නොවේ. මහජන ඡන්දයෙන් පත්විය යුතු අතර රජු භූමියේ හිමිකරු හා පාලකයා වේ. ජනතාවගේ අයිතිවාසිකම් ආරක්ෂා කර දීම පාලක කාර්යය වෙයි. පාලකයා වෙත පැවරී ඇති බලය ජනතාව විසින් පවරන ලද බලයක් වේ. රටේ රජු ජනහිතකාමියකු විය යුතු බව පූර්ව කරුණුවලින් පැහැදිලි වේ. රජකු සම්පූර්ණයෙන් ම දැහැමින් ආචාර ධර්මවලට අනුව පාලනයක් ගෙන යා යුතුයි. දස සක්විති වත් කොටස් 14 කින් යුත් ජාතික ප්‍රතිපත්තියක් මෙන් ම එහි පාලකයා සතු විශේෂ වගකීම් කිහිපය ඉතා වැදගත් බව සඳහන් කොට ඇත්තේ විජේබණ්ඩාර සහ මොරටුවගම (1985, පි. 128) ය. **ඊට අනුගතව** රජු මනුෂ්‍යයන් මෙන් ම මෘග **පක්ෂීන්** ද ඇතුළත් ව සමස්ත සත්ත්ව ප්‍රජාවට ම ධාර්මික රැකවරණය ලබා දිය යුතු වේ. ඊට අමතරව ආර්ථික සමෘද්ධිය ඇතිකළ යුතුයි. රාජ්‍යයේ අපරාධ මර්දනය කළ යුතු අතර පූජනීයයන් ඇතුළු බහුශ්‍රැතයන්ගේ උපදෙස් ලබා රටේ පාලන කටයුතු විධිමත් ව කර ගෙන යා යුතුයි (විජේබණ්ඩාර සහ මොරටුවගම, 1985).

මෙයින් පෙනී යන්නේ රජුගේ මූලික යුතුකම හා වගකීම වන්නේ මුළුමහත් සත්ත්ව ප්‍රජාවට ම රැකවරණය සැලසීම බව යි. මේ සඳහා රජෙකුට ප්‍රතිපත්ති ගණනාවක් ම පිළිපැදිය යුතුවෙයි. රජු ධාර්මික වීම ඒ අතර කැපී පෙනෙන කරුණකි. ඔහු අධාර්මික වුවහොත් රජ පවුලේ සියලු දෙනාම ද, අමාත්‍යවරුන් ද, රාජ නිලධාරීන් ද, අධාර්මික වෙයි. එසේ වුවහොත් රාජ්‍ය පාලනය දුර්වල වන අතර රටේ මහජනතාවගේ පරිහානිය ආදිය සිදුවෙයි. මේ නිසා රජ යහපත-අයහපත හොඳින් හඳුනාගෙන ජනතාව පිළිබඳ අවබෝධයෙන් රටේ පාලනය මෙහෙය විය යුතුය. රටේ ආරක්ෂාව, විදේශ ආක්‍රමණවලින් රට බේරා ගැනීම රටේ ස්ථාවරබව ඇති කිරීම රජුගේ වගකීම වේ.

රජුට පැවරුණ රාජකාරි අතර අන්‍යාය නිවාරණය ද ඇතුළත් ය. රජු නීතිය දැන ගත් කෙනෙකු විය යුතුය. වංසත්ථප්පකාසිනිය අනුව නීති විශාරද පුරුෂයා හෙවත් නීතියේ දක්ෂ පුරුෂයා විය යුතුය (අමරවංශ හිමි, සහ දිසානායක, 2001, පි. 491). රජු පමණක් ම නගරයකම, සෑම ග්‍රාමයකම, ජනපදයකම, සාධාරණය යුක්තිය ඉටුකිරීම සංකීර්ණය. එබැවින් මහාධිකරණය ශාලාවල, අතිරේක තම පාලන ප්‍රදේශයේ විවිධ ස්ථානවල අධිකරණ ශාලා පිහිටුවීමත් විනිශ්චයකරුවන් පත් කර අපරාධ නිරාකරණය කිරීමටත් රජු දක්ෂයෙකු විය යුතු අතර තමන්ට ද ඒ හැකියාවන් තිබිය යුතුය. ඒ සඳහා සුදුසුකම් ගණනාවක් සපුරා තිබිය යුතුය. එසේම රාජ්‍යත්වයට පත්වීමෙන් පසුව ද රටේ සියලුම කටයුතුවල ප්‍රධානත්වය රජුට හිමිව ඇති අතර ඒ වගකීම් හා යුතුකම් ඉටු කිරීම රජුගේ රාජකාරිය බවට පත්ව ඇත.

බදුලු ටැම් ලිපියේ මහරජ, වත් හිමියන්, වහන්සේ ආදී වශයෙන් දක්වා ඇත්තේ රජතුමාට ය. මේ පිළිබඳ ව සඳහන් සෑම අවස්ථාවක දී ම පෙනී යන්නේ රාජ්‍යයක පැවැත්ම හා ආරක්ෂාවට 'මහරජ' නම් වූ ප්‍රධාන පාලකයෙකු සිටි බවකි. රටේ සමාජ, සංස්කෘතික, දේශපාලන හා ආර්ථික සියලු සංස්ථාවන්ගේ දියුණුව සම්බන්ධයෙන් ක්‍රියාත්මක වීම මහරජු සතු වූවකි. අනෙකුත් තනතුරු ඊට සහාය වීමට පවත්වාගෙන ගොස් ඇති බව පෙනේ. මහරජු රටේ ප්‍රධානත ම තනතුර වූ අතර 'රජ'නාමය ද පසුකාලයේ දී මහරජ සඳහා ම භාවිත කොට ඇත. මුල්කාලයේ දී ප්‍රදේශ පාලන ගෙනගිය අය රජ, රජු නාමයෙන් හඳුන්වා ඇත. කතරගම ශිලා ලිපියක මහානාග රජු පිළිබඳ ව දැක්වීම නිදසුන් ය (Epigrapia Zeylanica, Vol. 1, 218p). ඉතිහාස ගත තොරතුරු අධ්‍යයනයේ දී පැහැදිලි වන්නේ එක් එක් කාලයේ දී මහරජ, රජ භාවිත කොට ඇති ආකාරයේ වෙනසක් පවතින බවකි.

මජ්ඣිම නිකාය අටුවා පාඨයක සඳහන් වන්නේ යම් ජනපදයක ඇති වූ නඩුව (ග්‍රාම භෝජක) වෙතට ආවොත් ඔහුට එය විනිශ්චය කළ නොහැකි කල්හි ජනපද (Janapada) භෝජකයා (දනවු පාලකයන්) වෙත ගෙන යා

යුතුය. ඔහුට ද නොහැකි වූ කල්හි මහා විනිශ්චය මහාමාත්‍යා වෙත රැගෙන යා හැකි අතර ඔහුට ද නොහැකි වූ සේනාපති කරාද ඔහුට ද නොහැකි වූ විට යුවරජුට ද ඔහුට ද විසඳිය නොහැකි වූ කල්හි රජුට ද ගෙන යා හැකිය. රජු ඒ විනිශ්චය කළ යුතු අතර එහි වෙනසක් නැවත ඇති නොවේ. රජුගේ රාජකාරීන් අතර රටවැසියා ආරක්ෂා කිරීම, සාසනය ආරක්ෂා කිරීම, ප්‍රධාන ය. ඒවා පැහැර හැරීම ඔහුගේ හිස සත් කඩක් පැලීමට හේතුවක් වන බවට සඳහන් ය (අමරවංශ හිමි, සහ දිසානායක, 2001, පිපි. 230-231).

බදුලු ටැම් ලිපියේ අන්තර්ගතයන්ට අනුව මෙන් ම ද්විතීයික මූලශ්‍රවල කරුණු විමර්ශනයේ දී රටේ නායකයා මෙන් ම ජනතාව පිළිබඳ සියලු වගකීම් දැරූ ප්‍රධානියා ද ඔහුම විය. බදුලු ටැම් ලිපියට අනුව ද රජු පැමිණි අවස්ථාවේ උද්ඝෝෂණ ද ඇති කර නිලධාරීන්ගේ විසඳාගත නොහැකි දේ රජුගෙන් ම විසඳා ගැනීමට උත්සාහ දැරීමෙන් ද පෙනී යන්නේ රජුට කොතරම් වගකීම් සම්භාරයක් පැවති තිබුණේ ද යන්නය. එසේ ම නීති සැකසීමේ ප්‍රධානත්වය ද රජුට ම හිමිව ඇති බව මේ ටැම්ලිපියේ තහවුරු වේ. එබැවින් රාජ්‍යත්වය අනුව මහරජ යන්න රටේ ම නායකයාටත්, රජ, ඇතැම් විට ප්‍රාදේශීය පාලකයන්ටත්, තවත් අවස්ථාවක දී රටේ ම රජුටත් භාවිත කොට ඇති බවත් සඳහන් කළ හැකිය.

වත් හිමියන් වහන්සේ යන්න පරණවිතානයන් දක්වා ඇත්තේ සංස්කෘත භාෂාවේ පැමිණි වස්තු ස්වාමි (දේපල හිමියන්) හෝ ව්‍රත ස්වාමි (ආගමික වෘත රකින ආචාර්යවරුන්) වශයෙන් බිඳී ආවක් ලෙස යි. එය රජවරුන්ට ආදේශ කර ඇති බව ද දක්වා තිබේ. (Epigrapia Zeylanica Vol.1 35p.). කොත්මලේ අමරවංශ හිමියන්ගේ අදහස වන්නේ ගිහි - පැවිදි දෙපාර්ශ්වයට ම භාවිත කොට ඇති බව යි. (අමරවංශ හිමි, 1969, පි. 219) ඒ අතර රජු හෝ ආගමික නායකයෙකුට භාවිත කළා විය හැකි බව යි. එමෙන් ම රජ කෙනෙකුට භාවිත ගෞරවනීය නමක් වශයෙන් ද යොදා ඇති බව සිරිමල් රණවැල්ලගේ අදහස යි (රණවැල්ල, 2003).

එසේ ම වැඩි තැන යන්න ද ගෞරවනීය බව දැක්වීමට භාවිත නමක් බව පරණවිතානයන් දක්වා තිබේ. ද්විත්ව මූලාශ්‍රයන්ට අනුව පූර්ව කරුණු විමර්ශනයේ දී මහරජ, වත්හිමි වැඩි තැන යන නම් මහ රජතුමා හැඳින්වීම සඳහා භාවිත කොට ඇති බව සඳහන් කළ හැකිය.

බදුලු ටැම් ලිපියට අනුව රටේ මහ රජු වීමේ දී සපුරාලිය යුතු සුදුසුකම් අතර ඈපා, මහයා තනතුරු ද උසුලා තිබිය යුතු බව පෙනේ. අය්‍යපාද යන්න ද උතුම් ආර්ය කුමාරයා යන්න සුමංගල ශබ්දකෝෂයේ අර්ථ සපයා ඇත. (සෝරත හිමි, 1999, පි. 153). පණවිතානයන්ගේ අදහස ඉපැරණි බ්‍රාහ්මී සෙල්ලිපිවලට අනුව රජකුමාරවරුන්ගේ ගරු නාමයකි. ඒ අතර ඈපා යන්න සෑම රජ කුමරෙකුට ම ප්‍රදානය කෙරුණු ගරු නාමයක් බවත් මහයා යන්න ඊටුන්න හිමි කුමාරයාට ප්‍රදානය වූවක් බවත් කොත්මලේ අමරවංශ හිමියන්ගේ අදහසයි. (අමරවංශ හිමි, 1969. පි. 218). ඒ අතර තවදුරටත් දක්වා ඇත්තේ රජ වීමට පෙර ඈපා, මහයා තනතුරු දරා සිටිය යුතු බවකි. (අමරවංශ හිමි, 1969, පි. 218)). බොහෝ සෙල්ලිපිවල භාවිතයන්ට අනුව මහයා, මහාදිපාද යෙදී ඇත. (Ranawella, 1999, 9|35. 6p.).

බ්‍රාහ්මී සෙල්ලිපිවල රාජ කුමාරවරුන්ගේ ගරු නාමයන් වන "අය" යන්න "ඈ" වශයෙන්ද "පය" යන්න "පා" ලෙස ද ව්‍යවහාරයට ඈයා ලෙසත් මහ+ අය මහයා ලෙසත් සැකසී ඇති බව ද පිළිගැනෙයි. (විද්‍යාලංකාර විශ්වවිද්‍යාලය, 1964, පි. 327).

ඒ අනුව ඈපා යන්න සෑම රජ කෙනෙකුට ම ප්‍රදානය කෙරෙන ගරු නමක් වශයෙන් ද මහයා යන්න ඊටුන්න හිමි කුමාරයාට භාවිත ව ඇති බවත් පසුව එය උපරාජ හා යුවරාජ ලෙසත් යෙදී ඇති බව පිළිගැනේ. (අමරවංශ හිමි, 1969, පි. 218). මාපා, මහයා, මහා ආදිපාද නමින් හඳුන්වන මහයා උප ප්‍රාදේශීය භූමි කොට්ඨාසයක පාලනය මෙන් ම දක්ෂිණ දේශය මායාහට හිමි බවත් (මායා රට) මේ නිලධාරියාගේ පාලනයට නතු වන ප්‍රදේශය ලෙස පිළිගැනේ. (අමරවංශ හිමි, සහ දිසානායක, 2001, පි. 193). බදුලු ටැම් ලිපියේ රාජ්‍යත්වය ලැබීම සඳහා සපුරාලිය යුතු සුදුසුකම් දෙකක් ලෙස ඈපා, මහයා පෙනී යයි.

ඈපා මහයා සිරි විදැ පිළිවෙළ
සෙ රුදැ පැමිනැ රුදැ කළ
(Epigrapia Zeylanica Vol. III., 1933, 11p.)

මේ යෙදීම මෙන් ද්විත්ව මූලාශ්‍ර කරුණු විශ්ලේෂණයේ දී පෙනී යන්නේ රාජ්‍යත්වය ලැබීමට පෙර ආදීපද හා මහාදිපාද ද්විත්ව සුදුසුකම් ලබා සිටිය යුතු බවය. රාජ කුමාරවරුන්ට ඇතැම් විට ඈපා තනතුර ලබා දෙන්නට ඇත්තේ රජකම හිමි අයට පමණක් වීමට ද හැකියාව ඇත. රටේ පාලනය ලබා ගැනීමට පෙර රට මෙන් ම රටේ පාලන කටයුතු පිළිබඳ ව පූර්ව අත්දැකීම් දැරීමේ තනතුරු යැයි සැලකිය හැකිය.

මේ සෙල්ලිපියෙන් හඳුනාගත හැකි තවත් තනතුරක් වන්නේ දඩ නායකයයි, මේ දඩ නායක, දඩ නායක, දඬි නායක යන්න ද හමුදාවේ සේනාපති වැනි උසස් නිලධාරීන්ට ප්‍රදානය කළ නිල නාමයක් වශයෙන් පිළිගැනෙයි. මුල් අර්ථය විනිසුරු යන්න ද අර්ථ දැක්වේ. (Epigrapia Zeylanica 1.4. 23., Epigrapia Zeylanica. Vol. 1, 1929, B11. 16. A. 21) දණ්ඩනායක ශබ්දය ගුප්ත ශිලා ලේඛනයන්හි හමුවන නිලධාරී නාමයක් බවත් එමගින් යුද සෙනෙවියන් හැඳින්වූ බවත් පිළිගැනෙන හෙයින් ඇතැම් විට පරණවිතානයන් පූර්ව අදහස දක්වන්නට ඇත. දඩ නායක නතුරෙන් රජයේ දඩ මුදල් අය කළ මණ්ඩලයේ ප්‍රධානියා වශයෙන් ද පිළිගැනේ. එමෙන් ම කෘෂිකාර්මික කටයුතු මිනිසුන් ලවා කරවීමේ නිලධාරියා ලෙස ද අදහස ගත හැකි බව තවත් ඉදිරිපත් කිරීමකි. (විමලකීර්ති හිමි, 1957, පි. 260) අධිකරණ සංවිධානයේ ප්‍රධානියා බව ද නඩු ඇගයීම් දඩ මුදල් පිළිබඳ තීරණය දීම දඬුවම් දීම ආදී කටයුතුවල බලතල දඩනායකට හිමි වී තිබූ බව ද පිළිගැනේ. (සුරවීර, 2009, පි. 20).

සිංහල ශිලා ලේඛන සංග්‍රහයෙහි සඳහන් ව ඇත්තේ කඩමණ්ඩියේ ප්‍රධාන මුලාදෑනින්ගේ සේවකයෙක් වශයෙනි (මුදියන්සේ, 2000, පි. 264). පදිය යන්න වෙළෙඳ පල බැවින් වෙළෙඳ පල, වෙළෙද නගරය හඳුන නාමය බැවින් වෙළෙඳ නගරය ලද තැනැත්තා, පදිය පාලනය කරන නිලධාරියා යන්න භාවිත බවට ද අදහස් වෙයි (විමලකීර්ති හිමි, 2001, පි. 31).

බදුලු ටැම් ලිපියේ අන්තර්ගත පදිලත් දඩ නායකයන් (21 -22) යන්න විමසීමේ දී පැහැදිලි වන්නේ වෙළෙඳපල ලැබූ දණ්ඩ නායකයන් හා ඔහුගේ සේවකයන් පූර්ව චාරිත්‍ර කඩ කරමින් දඩ ගැනීම් ආදිය සිදුකර ඇති බවයි. ද්විත්ව මූලාශ්‍රවල දැක්වීම් ද විශ්ලේෂණාත්මකව අධ්‍යයනයේ දී පෙනී යන්නේ රටේ පාලන කටයුතුවල ප්‍රධානියා රජු වුව ද ඒ පාලන කටයුතුවලට සහයෝගය දැක්වීමට විවිධ නිලධාරීන් මෙන්ම ඔවුන්ට සහායට සේවකයන් සිටි බවයි. ඒ අතර බදුලු ටැම් ලිපියේ පදිලත් දඩනායක යන්න වෙළඳපළේ නගරයේ පාලන කටයුතු ගෙන ගිය ප්‍රධාන නිලධාරියා වෙයි. ඒ අනුව පෙර පැවැතියාවූ නීති රීති විධිමත්ව ක්‍රියාත්මක කිරීම, අයබදු මෙන් දඩ ආදිය ලබා ගැනීම, වෙළෙඳපොළ පාලනය ආදී සියලු කටයුතු මෙම නිලධාරියාට පැවරී තිබූ බවයි.

ඒ අතර ගැත්තන් පිළිබඳ ව ද සඳහන් ය. සුමංගල ශබ්ද කෝෂයට අනුව ගැති දාසිය යන්න අදහස් වේ (සෝරත හිමි, 1999, පි. 332). ගැති ශබ්දයෙන් දාසිය, සේවකයා, දස්කම් ගන්නා වැනි අර්ථ කිහිපයකට එකතු වන බව අමරවංශ හිමියන්ගේ අදහසයි (අමරවංශ හිමි, 1969, පි. 219). සේවකයා, Servant retainer අයිති වූ Belonging to සිංහල සාහිත්‍යයට අනුව දැක්විය හැකි බව පරණවිතානයන් ඉදිරිපත් කර ඇත (Epigrapia Zeylanica. Vol. V, 1963, 189p.). මේ කරුණු විශ්ලේෂණයේ දී පෙනී යන්නේ නිලධාරීන්ට සහාය වීමට සිටි අය ගැත්තන් වශයෙන් සැලකිය හැකි බවකි.

බදුලු ටැම් ලිපියේ ඇතුළත් තවත් තනතුරු නාමයක් ලෙස මන්ද්‍රඩීන් හැඳින්විය හැකිය. සෙල්ලිපි පාඨ සඳහන් ව ඇත්තේ: (මේ හොපිටිගමු පදිලද් කෙනෙකුන් ගැත්තන් ගමට් ආ කලැ මන්ද්‍රඩින් වණිග්‍රාමයන් මහාග්‍රාමයන් හින්දැ ....දඩ ගනුත් මිසැ අනියා නොකරනු ඉසා... ගම්ලද්දන් ගැත්තන් මන්ද්‍රඩින් හින්දැ විතාර කොට් පිරිකපා දුන් දඩ ගනුත් මිසැ... (අ. 40- ආ 15 පේළි) යන දැක්වීමේ දී පෙනී යන්නේ දඩ හා බදු මුදල් එකතු කිරීමට සහභාගි වූ නිලධාරියෙකු බවයි.

නමුත් ද්විත්ව මූලාශ්‍ර ද උපයෝගී කොටගෙන මේ පිළිබඳ ව තවදුරටත් අධ්‍යයනය යෙදිය හැකිය. සිංහල ආණ්ඩුව කෘතියේ සඳහන් වන්නේ නීතිවේදියෙක් බවයි. යම් යම් කටයුතු සඳහා අයවිය යුතු අයබදු මෙන් ම දඩ මුදල් තීරණය කිරීමට නීතිය පිළිබඳ හොඳින් දැනගෙන සිටිය නිලධාරියා මොහු වන බැවිනි. (විමලකීර්ති හිමි, 2001, පි. 25). සිංහල ශිලාලේඛන සංග්‍රහයේ ඇතුළත් ව ඇත්තේ දෙමළ භාෂාවෙන් පැමිණි තනතුරක් වශයෙනි. ඒ අනුව මන්රාඩිහෝ මන්තද + ආදී ප්‍රභවය වී යැයි සැලකේ. ගම් සභා සේවක යන අර්ථය ගත හැකි බවත් එමෙන් ම උසාවියක නඩු විභාගයක දී කෙනෙකු වෙනුවෙන් පෙනී සිටින නීතිඥයා වශයෙන් ද පිළිගැනේ. (මුදියන්සේ, 2000. පි. 262). සාහිත්‍යයේ දී මෙහි අර්ථය අතරමැදියෙකු (Intermediary) වශයෙන් සඳහන් වෙයි. මේ පිළිබඳ ව තවදුරටත් අදහස් ඉදිරිපත්ව ඇත්තේ වෙනත් කෙනෙකුගේ හේතුවකට තව කෙනෙකු අධිකරණයේ පෙනී සිටිමින් ආයාචනා කිරීමක් වශයෙනි. (Epigrapia Zeylanica. Vol. V, 1963, 190p), එමෙන් ම මන්ත්‍රිතුමා, උපදේශක යන අදහස ගත හැකි බව ද පිළිගැනේ. (Epigrapia Zeylanica Vol. V,1963, 189p) බදුලු ටැම් ලිපියට අනුව වෙළෙඳපළ ලැබූ (පදිලත් දඩනායකයන්) නිලධාරියා /ව්‍යාපාරිකයා යන ඔහුගේ සේවකයන් කරන ලද වැරදිවලට මෙන්ම වෙළෙඳපළ ආදී කටයුතුවල දී දඩ ගැනීමේ කාර්යය, ඊට අදාළ අනෙකුත් නිලධාරීන් සමග එකතුව සිදු කිරීම මේ නිලධාරියාට පැවරී ඇත.

මහා ග්‍රාමයන් යන්න ද මේ ලිපියෙහි ඇතුළත් තවත් නාමයකි. මෙයින් අදහස් වන්නේ හෝපිටිගම ප්‍රධානයන් යන අදහස යැයි පිළිගැනේ (අමරවංශ හිමි, 1969, පි. 220). එමෙන් ම රාෂ්ට්‍රකූට ලිපියේ මීට සමාන නාමයක් ඇතුළත් ය. ග්‍රාම මහන්තරාය වශයෙන් යෙදී තිබෙන බවත් මහා ග්‍රාම පාලනය කළ සභාව හෝ මහාග්‍රාමය විය හැකියි යන්න ද පිළිගැනේ. මහා කොමිටියක ප්‍රධානයන් ද මහාග්‍රාම ශබ්දයෙන් අදහස් වන බවත් මහා ග්‍රාමය පාලනය කළ සභාව මහාග්‍රාය විය හැකි බව ද පිළි ගැනේ (විමලකීර්ති හිමි, 1957).

පරණවිතානයන්ගේ අදහස වන්නේ රාෂ්ටකූට සෙල්ලිපියේ සඳහන් ග්‍රාම මහන්තරාය යන්න එවැනි ම වූ විශේෂත්වයකින් යුක්ත බවයි. එබැවින් මහා හෝ හෝපිටිගමු වාසස්ථානය විය හැකි යැයි දක්වා තිබේ (Epigrapia Zeylanica Vol. V, 1963, 190p.). බදුලු ටැම් ලිපියේ සඳහන්ව ඇත්තේ:

මේ හොපිටිග -
-මු (පදිලද් ) කෙනෙකුන්
ගැත්තන් ගම්මි ආ (ක -
-ලැ ) මන්ද්‍රඩින් වනිග්‍රාම -
-න් මහග්‍රාමයන් හින්දැ
සකළො ද පිරිනිවියන්
වහන්සේ දවසැ
වැවස්ථා සෙ පෙරෙසිරි
-ත් දඩගනුත් මිසැ අනි
(යා) නො කරනු ඉසා
(අ: 39 - ආ 01)

මෙයින් පෙනී යන්නේ හෝපිටිගමු වෙළඳපල ලැබූ ව්‍යාපාරිකයා ඔහුගේ සේවකයන් ගමට, වෙළඳපොළට පැමිණි කල පෙර සිරිත් මත දඩ ගැනීමයි. මීට වෙනත් නිලධාරී න් ද එකතු වී ඇත. මහා ග්‍රාමයන් යන්න හෝපිටිගමු ගමෙන් අයබදු හා දඩ මුදල් ගැනීමේ දී ඒ සඳහා පත් කර ගෙන සිටි නිලධාරීන් පිරිසකි.

රදොලන් කුමන පිරිසක් ද යන්න ද විමසීම වැදගත්ය. රාජ්‍ය කුලික වශයෙන් පරණවිතාන සඳහන් කොට ඇති අතර (Epigrapia Zeylanica. Vol. V, 1963, 191p.) රාජ කුලිකයන් වශයෙන් සඳහන් කොට ඇත්තේ විමලකීර්ති හිමියන්ය. (විමලකීර්ති හිමි, 1957. පි. 62) ඒ. වී. සුරවීර සඳහන් කොට ඇත්තේ රට හා සම්බන්ධ වන නිධාරීන් ය. මේ අය රදොලන්, රද්කොල් කැමියන් සේ හැඳින්වූහ (සුරවීර, 2009. පි. 154). සුමංගල ශබ්දකෝෂයේ රාජ කුලය, රාජ පරම්පරාව, රජ මැදුර, රාජ කුලිකයන්, රාජ්‍ය සේවකයා ආදී වශයෙන් අර්ථ දී තිබේ. කොත්මලේ අමරවංශ හිමියන්ගේ දැක්වීම වන්නේ සාමාන්‍යයෙන් රාජ කුලයක් යන අදහස ගත හැකි බවයි. එසේ වුව ද රට යනුවෙන් වෙන් කොට ගෙන තිබූ පාලන ඒකකය සම්බන්ධ නිලධාරීන් රදළයන් ලෙස හැඳින්වූ බවත් රද් කෝල්, රජ්කෝල් කැමියන් වශයෙන් ඇතැම් විට රදළයන් හඳුන්වා ඇති බව සඳහන් කොට තිබේ (අමරවංශ හිමි, 1969. පි. 221).

බදුලු ටැම්ලිපිය ට අනුව: නො තැනැ තබා වික්ක දුටුවා රදොලන් හරවා ග-න්නා ඉසා .........
(ඉ. 31-32)-
ගම්හිලා මිනී කොටා යත් රදොලනට (ලැබී) නවත්නා සෙයි නවතනු ඉසා (ඊ. 8-12)

ශිලා ලිපියේ සඳහන් ආකාරය මෙන් ම ද්විත්ව මූලාශ්‍ර දැක්වීමේ දී විවිධ රාජකාරීන් හිමිව තිබූ රාජකීය නිධාරීන් යන්න අර්ථ ගැනීම පහසුය. එමෙන් ම මේ නිලධාරීන් ගම්වල මිනිසුන්ට කරදර කර ඇති බවක් ද පෙනී යයි. (ගම ට් ආ රදොලන් රහ මස් දී ගිතෙල් නොගන්නා ඉසා…(ආ; 20-22)

උල්වාඩු කණක්කරුන් යන්න කොණ්ඩවට්ටවාන් ටැම් ලිපියේ ද යෙදී ඇත. ඒ අනුව රජයේ කාර්යාලයක සිටියා වූ අපරාධ පිළිබඳ ව සොයා බැලීම සිදු කරන නිලධාරියා යන්න හැඟෙන බව පරණවිතානයන්ගේ අදහසයි. රජගේ ඇතුළත සංගීත පවත්වන අය යන්න සඳහන් කොට තිබේ (Epigrapia Zeylanica. Vol. III., 1933, 140p.). විමලකීර්ති හිමියන්ගේ අදහස වන්නේ අයබදු අය කරන්නන් ලෙසත්, ග්‍රාම ආරක්ෂකයන් ලෙසත් සැලකිය හැකි බව යි. එමෙන් ම කණක්කාර් ද්‍රවිඩ ස්වරූපයක් ගන්නා අතර ගණන් හිලව් පාලන නිලධාරියා බවට ද කරුණු ඉදිරිපත් ව ඇත. (Epigrapia Zeylanica. Vol. V., 1963, 190p.) සෙල්ලිපියට අනුව: වැළැතැ වන උල්වාඩු කනක්කරුන් ගමට් ආකුළ නො කරනු ඉසා ... (ආ; 41-44) සඳහන් ව ඇත්තේ සමීප ව වාසය

කරන නිලධාරීන් පිරිසක් බවයි. නන්දසේන මුදියන්සේ බදු අය කරන්නන් වශයෙන් දක්වා ඇත (විමලකීර්ති හිමි, 1957, පි. 265). එසේ වැඩි විස්තර දැක්වීදේ ද උල්වාඩු, උල්පාඩු නිලධාරි විශේෂයක් බව සඳහන් කොට තිබේ. එමෙන් ම දකුණු ඉන්දියානු සෙල්ලිපිවලට අනුව උල්පාදන් සහ පෙරුමුදියාන් නිලධාරීන් විශේෂයක් බවත් ඔවුන් හින්දු කෝවිල්වල මුදල් අර පරිස්සමට සිටි බවත් වැඩි දුරටත් දක්වා තිබේ (විමලකීර්ති හිමි, 1957, පි. 263). මේ දැක්වීම් විමර්ශනයේ දී මෙන් ම සෙල්ලිපිවල සඳහන් ව ඇති ආකාරය විමර්ශනයේ දී නිශ්චිත අර්ථයක් දැක්වීම අසීරු වුවත් වෙළඳපළ හා ගමෙහි අය බදු හා දඩ ගැනීම ආදියට සම්බන්ධ නිලධාරීන් විශේෂක් යැයි සැලකීමට අවකාශ බොහෝ වෙයි.

බදුලු ටැම් ලිපියේ ඇතුළත් තනතුරු අතර ගම අඩවිය අටදෙනා හා වරද දඩ අට දෙනා ද වැදගත්ය. රණවීර ගුණවර්ධන පාලක සභාව පිළිබඳ ව අදහස් දක්වා තිබේ. එහි දී මිහින්තලේ ලිපි කම්කැන් වශයෙන් සැකසුන පාලක සභාවක් පිළිබඳ ව අර්ථ ගැන්වෙන බව ඔවුන්ට හිමි ව තිබූ රාජකාරීන් සමඟ පෙන්වා දී තිබේ. ඒ පාලක සහා සාමාජිකයන් අට දෙනෙකුගෙන් යුක්තයි (ගුණවර්ධන, 1962, පි. 102). විමලකීර්ති හිමියන්ගේ අදහස නිලධාරි පිරිසක් බව යි. මේ පිරිස 8, 12 වශයෙන් සංඛ්‍යාවලින් යුක්ත වී ඇත. එවැනි කොමිටි විශේෂයක් වූ බවත් නිදසුන් ද ඇතැයි දක්වා ඇත. ගම්පළාත කොමිටියකින් නියුක්ත අටදෙනා ගම්හි අටදෙනා යැයි සැලකිය හැකි බව ද දක්වා ඇත. (විමලකීර්ති හිමි, 1957, පි. 72) වරද දඩ අටදෙනා යන්න දක්වා ඇත්තේ දඩ අය කරන මුලාදෑනීන් අටදෙනා බවයි (විමලකීර්ති හිමි, 1957, පි. 73). මේ ගම අඩවිය අටදෙනා, වරද දඩ අටදෙනා වැනි නිලධාරීන් පිළිබඳ ව නිශ්චිතව කරුණු දැක්වීම ද අසීරුය.

බදුලු ටැම් ලිපියේ ඇතුළත් තනතුරු නාම අතුරෙන් මේ අධ්‍යයනයට පාදක කරගත්තේ මහරජ, රජ, ඈපා, මහයා, රද්කොල්, දඬනායක, ගැත්තන්, මන්ද්‍රඩීන්, මහාග්‍රාමයන්, උල්වාඩුකණක්කරුන්, ගම අඩවිය අටදෙනා හා වරද අට දෙනා පිළිබඳ ව පමණි. ඒ සම්බන්ධයෙන් කරුණු දැක්වීමේ දී ඇතැම් තනතුරු පිළිබඳ ව නිශ්චිතව ම නිගමනවලට ඒමට ද්විතීයික මූලාශ්‍ර සාධක කරගත්ත ද සංකීර්ණය. මේ අධ්‍යයනයේ දී බදුලු ටැම් ලිපියේ මේ තනතුරු යෙදී ඇති අවස්ථා ද ඒ ඒ තනතුරු දැරූවන්ගේ ක්‍රියා කලාපයන් ද ඇතැම් විට සඳහන් ව ඇති රාජකාරිය පදනම් කොට ගෙන ද, මේ සම්බන්ධයෙන් පර්යේෂණ මෙන් ම විවිධ ශාස්ත්‍රීය අධ්‍යයන ඇසුරින් දක්වා ඇති අදහස්වල උපයෝගීතාවෙන් එනම් ද්විතීයික මූලාශ්‍රවල ඒ තනතුරු නාම විග්‍රහ කොට ඇති ආකාරය ද තුලනාත්මක අධ්‍යයනයකින් මේ තනතුරු නාමවලින් ප්‍රකට තනතුරුවලට හිමි ව තිබූ රාජකාරීන් පිළිබඳ ව කරුණු ඉදිරිපත් කිරීමට මේ අධ්‍යයනයේ දී පෙළඹුණි.

**ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය**

අභයවර්ධන, ඒච්. ඒ. පී. (1978). *කඩයිම් පොත් විමර්ශනය.* සංස්කෘතික දෙපාර්තමේන්තුව.

අමරවංශ හිමි, අකුරටියේ සහ දිසානායක, එච්. (2001). *මහාවංශ ටීකාව (සිංහල අනුවාදය).* එස්

ගොඩගේ සහ සහෝදරයෝ

අමරවංශ හිමි, කොත්මලේ. (1969). *ලක්දිව සෙල් ලිපි.* ගුණසේන සහ සමාගම.

අමරවංශ හිමි, කොත්මලේ සහ දිසානායක, එච්. (2001). පි. 491

අමරසේකර, ඩී. (1961). *සිංහල ශිලා ලේඛන විවරණය* 01 කාණ්ඩය. එම් ඩී ගුණසේන සහ සමාගම.

ආරියපාල, එම්. බී. (1962). *මධ්‍යකාලීන ලංකා සමාජය.* රාජයේ මුද්‍රණාලය.

ඇදගම, එම්. [දි.නැ]. *ලංකාවේ ගම්සභා ක්‍රමයේ ඉතිහාසය.* සරස්වති ප්‍රකාශන.

කරුණාරත්න, ඩබ්ලිව්. එස්, *ශිලා ලේඛන සංග්‍රහය.* එම්. ඩී. ගුණසේන සහ සමාගම.

කුලතුංග, ටී. ජී. (1988). මධ්‍යකාලීන ලංකාවේ ආරක්ෂක සංවිධාන. එස්. ගොඩගේ සහ සහෝදරයෝ.

ගයිගර්, ඩබ්. (1965) *මධ්‍යකාලීන ලංකා සංස්කෘතිය.* ගුණසේන සහ සමාගම.

ගුණවර්ධන, ආර්. (1962). *සිවුර හා නඟුල* සමාජ විද්‍යාඥයින්ගේ සංගමය.

ජයවර්ධන, එස්. (1984). *අන්තර ගංගා.* ශ්‍රී ලංකා පුරා විද්‍යා සංගමය.

ධම්මරතන හිමි, හිස්සැල්ලේ (1963). *සිංහලයේ ද්‍රවිඩ බලපෑම්.* අනුලා මුද්‍රණාලය.

නන්ද හිමි, බලන්ගොඩ. (1992). *බෞද්ධ ආරාම සංවිධානය.* චන්ද්‍රා ප්‍රින්ටස්.

නොක්ස්, ආර්. කරුණාරත්න, ඩබ්. (පරි.). (1995) *එදා හෙළ හෙළදිව.* ගුණසේන සහ සමාගම.

පොන්නම්පෙරුම, ඩී. පී. (සංස්.). (1961). *විදේශීන් දුටු පුරාණ ලංකාව.* ආර්ය මුද්‍රණාලය.

බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය (සංස්). (1996). *සිංහල දීඝ නිකාය* ; සිංහල සූත්‍ර පිටක ග්‍රන්ථ මාලා අංක 01.

බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය (සංස්.). (2003). *මහාවංශය (සිංහල අනුවාදය)* නැදිමාල.

මනතුංග, ඩී. කේ. (2009). *පැරණි ලංකාවේ පාලන සංවිධානය.* තරංග ප්‍රකාශකයෝ.

මුදියන්සේ, එන්. (2000). *සිංහල ශිලාලේඛන සංග්‍රහය.* ගොඩගේ.

මෙන්ඩිස් ජී. සී. විජයසිංහ, එන්. එස්. (අනු.). (1963). *ලංකා ඉතිහාසයේ ප්‍රධාන බලවේග.* සීමාසහිත ඇපොතිකරීස් සමාගම.

රණවැල්ල, එස්. (2003). රෝහණ රාජ්‍යයේ ඉතිහාසය. රුහුණු විශ්වවිද්‍යාලයේ ප්‍රකාශනයකි

ලියනගමගේ, ඒ. සහ ගුණවර්ධන, ආර්. (සංස්). (1987). *අනුරාධපුර යුගය.* විද්‍යාලංකාර විශ්ව විද්‍යාලයේ මුද්‍රණාලය.

විජේබණ්ඩාර, සි., මොරටුවගම, එච්. එම්. (1985). ආදී බෞද්ධ චින්තනයඃ අදහස් කීපයක්. ගොඩගේ.

විද්‍යාලංකාර විශ්වවිද්‍යාලය. (1964). *ලංකා විශ්ව විද්‍යාලයේ ලංකා ඉතිහාසය.* I කාණ්ඩය, විද්‍යාලංකාර විශ්වවිද්‍යාලයේ මුද්‍රණාලය.

විද්‍යාලංකාර විශ්වවිද්‍යාලය. (1972). *ලංකා විශ්ව විද්‍යාලයේ ලංකා ඉතිහාසය.* I කාණ්ඩය, II භාගය. විද්‍යාලංකාර විශ්වවිද්‍යාලයේ මුද්‍රණාලය.

විමලකීර්ති හිමි, මැදඋයන්ගොඩ. (1957). *ශිලා ලේඛන සංග්‍රහය.* 1-5 කොටස, මොරටුව ඩී. පී. දොඩන්ගොඩ සහ සමාගම.

විමලකීර්ති හිමි, මැදඋයන්ගොඩ. (2001). *සිංහල ආණ්ඩුව.* එස් ගොඩගේ සහ සහෝදරයෝ.

විමලවංශ හිමි, බද්දේගම. (1959). *සෙල්ලිපි සමාජය.* අනුල මුද්‍රණාලය.

*සිඛවළඳ හා සිඛවළඳ විනිස.* (1999). ශ්‍රී ලංකා භාෂෝපකාර සමාගම සංස්කරණය, සුමුදු ප්‍රින්ටස්.

සුමංගල හිමි, හික්කඩුවේ. (සංස්). (1996). *මහාවංසය* ප්‍රථම භාගය, සීමාසහිත දීපානි මුද්‍රණාලය

සුමංගල හිමි, හික්කඩුවේ. (සංස්). (1996). *මහාවංසය* ද්විතීය භාගය, සීමාසහිත දීපානි මුද්‍රණාලය

සුරවීර, ඒ. වී. (2009). *අනුරාධපුර සමාජය.* ගොඩගේ.

සුරවීර, අයි. (2001). *රජරට විශිෂ්ට ශිෂ්ටාචාරය සහ නිරිතදිග රාජධානි.* දයාවංශ ජයකොඩි සහ සමාගම.

සෝරත හිමි, වැලිවිටියේ. (සංස්). (1999). *සුමංගල ශබ්ද කෝෂය.* ගොඩගේ,

Codrington, M. W., & Paranavitana, S. (Eds.). (1934). *Epigraphia Zeylanica: Vol. IV*.

Gunasekara, B. (1998). *The Evolution of the Sinhalese Script*. Godage.

Paranavithana, S. (1955). *Epigraphia Zeylanica: Vol. V, Part I*. Government Press.

Paranavithana, S., & Godakumbura, G. C. (Eds.). (1963). *Epigraphia Zeylanica: Vol. V Part II*. Government Press.

Ranawalla, S. (1999). *The Inscriptions of APA Kitagbo and King Sena I, Sena II and Udaya II.* Sri Dev Printers.

Wickramasinghe, D. M. D. Z. (Ed.). (1929). *Epigraphia Zeylanica 1904-1912.: Vol. I*. Oxford University Press.

Wickramasinghe, D. M. D. Z., & Codrington, M. W. (Eds.). (1933). *Epigraphia Zeylanica: Vol. III*. Oxford University Press.